ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය


| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2017 අගෝස්තු මස 01 වැනි දින |


## 2017 මැයි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

2017 මැයි මාසයේ දී සිදු කරන ලද 11 වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සහ ඒකාබද්ධ ණය පහසුකම තුළින් වූ ලැබීම් සමඟ ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම වෙත වූ සැලකිය යුතු ලැබීම් හේතුවෙන් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය ශක්තිමත් විය. 2017 අප්‍රේල් මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 5.0 ක් වූ දළ නිල සංචිත, 2017 මැයි මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.8 ක් දක්වා ඉහළ යෑමට මෙම ලැබීම් හේතු විය. රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් හුවමාරුව වෙත වූ අඛණ්ඩ ලැබීම් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ආයෝජකයන්ගේ විශ්වාසය අඛණ්ඩව වර්ධනය විය. කෙසේ වෙතත්, වෙළඳ හිඟය පුළුල් වීම සහ සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පැවතීම හේතුවෙන් ගෙවුම් තුලනයෙහි ජංගම ගිණුම මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පිළිබිඹු කළේය. අපනයන ආදායම අඛණ්ඩව තුන්වැනි මාසයටත් ඉහළ ගිය ද, ආනයන වියදමෙහි ඉහළ වැඩි වීම හේතුවෙන් වෙළඳ හිඟය තවදුරටත් පුළුල් විය. සමස්තයක් ලෙස, ධනාත්මක ආයෝජන අපේක්ෂා නිසා මූල්‍ය ගිණුම වෙත අපේක්ෂිත අඛණ්ඩ ලැබීම් සහ ජංගම ගිණුමේ අපේක්ෂිත ක්‍රමික වර්ධනය හේතුවෙන් 2017 වසරේ දෙවන භාගයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය වෙත ධනාත්මක බලපෑමක් ඇති වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**අපනයන ක්‍රියාකාරිත්වය**

2017 මාර්තු මාසයේ සිට පැවති පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන ආදායම ඉහළ යෑමේ ප්‍රවණතාව තවදුරටත් පවත්වා ගනිමින් 2017 මැයි මාසයේ දී අපනයන ආදායම අඛණ්ඩව තෙවැනි මාසයටත් ඉහළ ගියේය. මේ අනුව, 2017 මැයි මාසයේ දී අපනයන ආදායම, පෙර වසරේ අනුරූප මාසයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 780 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 841 ක් දක්වා සියයට 7.8 කින් ඉහළ ගියේය. මෙම වර්ධනය සඳහා කෘෂිකාර්මික අපනයන ඉහළම දායකත්වයක් දැක්වූ අතර දෙවනුව කාර්මික අපනයන දායක විය.

පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත හැර අනෙකුත් සියලුම කෘෂිකාර්මික නිෂ්පාදිතවල අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් 2017 මැයි මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 223 ක් දක්වා සියයට 32.0 කින් ඉහළ ගියේය. තේ අපනයන මිල ගණන් හා අපනයන පරිමාව යන දෙකෙහිම ඉහළ යෑම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී තේ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 132 ක් දක්වා සියයට 45.9 කින් ඉහළ ගියේය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි තේ මිල ගණන්වල ඉහළ යෑම පිළිබිඹු කරමින් තේ කිලෝග්‍රෑමයක් සඳහා වූ සාමාන්‍ය අපනයන මිල 2016 මැයි මාසයේ පැවති එ.ජ. ඩොලර් 4.24 ට සාපේක්ෂව 2017 මැයි මාසයේ එ.ජ. ඩොලර් 5.41 ක් දක්වා ඉහළ ගියේය. තවද, 2016 ඔක්තෝබර් මාසයේ පටන් දක්වන ලද පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව තේ අපනයන පරිමාව අඩු වීමේ ප්‍රවණතාව වෙනස් වී 2017 මැයි මාසයේ දී තේ අපනයන පරිමාව සියයට 14.3 කින් ඉහළ ගියේය. යුරෝපා වෙළඳපොළ වෙත මත්ස්‍ය නිෂ්පාදිත අපනයනය සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීමේ ප්‍රතිලාභ ලබමින් 2017 මැයි මාසයේ දී මුහුදු ආහාර අපනයන ආදායම, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 18 ක් දක්වා සියයට 40.5 කින් ඉහළ ගියේය. මීට අමතරව, කරාබු නැටි හා කුරුඳු අපනයන පරිමාව සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 21.9 කින් ඉහළ ගියේය.

2017 මැයි මාසයේ දී ප්‍රධාන වශයෙන්ම ඛනිජතෙල් නිෂ්පාදිත සහ රබර් නිෂ්පාදිත අපනයන ඉහළ යෑම හේතුවෙන් කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 615 ක් දක්වා සියයට 1.1 කින් ඉහළ ගියේය. නැව් සහ ගුවන් යානා සඳහා භාවිතා කරනු ලබන ඉන්ධනවල අපනයන පරිමාව සහ අපනයන මිල ගණන් යන දෙකෙහිම ඉහළ යෑම පිළිබිඹු කරමින් 2017 මැයි මාසයේ දී ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව

සියයට 63.8 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. මීට අමතරව, 2017 මැයි මාසයේ දී රබර් නිෂ්පාදිත අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 17.5 කින් ඉහළ ගිය අතර, රබර් ටයර සහ ශල්‍ය හා වෙනත් අත්වැසුම් අපනයනය සැලකිය යුතු ලෙස වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන ලෙස හේතු විය. යකඩ, වානේ හා ඒ ආශ්‍රිත උපාංග සහ මෙවලම් හැර අනෙකුත් සියලුම උපකාණ්ඩවලට අදාළ අපනයන ඉහළ යෑම පිළිබිඹු කරමින් 2017 මැයි මාසයේ මූල ලෝහ හා ඒ ආශ්‍රිත උපාංග අපනයන ආදායම, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සියයට 73.3 කින් ඉහළ ගියේය. තවද, මෙම මාසය තුළ දැව හා කඩදාසි නිෂ්පාදිත සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම ඉහළ ගියේය. කෙසේ වුවද, ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපා වෙළඳපොළ වෙත සිදු කරන ලද ඇඟලුම් අපනයනවල අඩු වීම පිළිබිඹු කරමින් 2017 මැයි මාසයේ දී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 359 ක් දක්වා සියයට 4.1 කින් පහළ ගියේය. මෙම මාසය තුළ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ ප්‍රවාහන උපකරණ අපනයන ආදායම් ද පහළ ගියේය.

සමුච්චිත වශයෙන් සැලකූ විට, 2017 වසරේ පළමු මාස පහ සඳහා වූ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 4,410 ක් දක්වා සියයට 4.3 කින් වර්ධනය වූ අතර, ඒ සඳහා තේ, කුළුබඩු, ඛනිජතෙල් නිෂ්පාදිත සහ මුහුදු ආහාර අපනයන ආදායම් ඉහළ යෑම හේතු විය. කෙසේ වුව ද, මෙම කාලපරිච්ඡේදය තුළ රෙදිපිළි හා ඇඟලුම්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයනවලින් ලද ආදායම් පහළ ගියේය.

ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය 2017 ජනවාරි සිට මැයි මාසය දක්වා ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයනය සඳහා ප්‍රධාන වෙළඳපොළවල් ලෙස පැවති අතර, එම රටවල් වෙත සිදු කළ අපනයන, මුළු අපනයන ආදායමෙන් සියයට 51 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2016 මැයි (ආ) (එ.ජ.ඩො. මිලියන) | 2017 මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2016 ජන-මැයි (ආ) (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **608.0** | **614.5** | **1.1** | **3,321.5** | **3,316.0** | **(0.2)** |
| රෙදිපිළි හා ඇඟලුම් | 374.7 | 359.2 | (4.1) | 2,084.5 | 1,985.5 | (4.7) |
| එයින්, ඇඟලුම් | 356.3 | 337.7 | (5.2) | 1,969.7 | 1,869.3 | (5.1) |
| රබර් නිෂ්පාදිත | 57.1 | 67.0 | 17.5 | 308.7 | 315.5 | 2.2 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 16.9 | 27.6 | 63.8 | 109.2 | 147.7 | 35.3 |
| ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 27.9 | 30.5 | 9.3 | 145.3 | 131.9 | (9.2) |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 27.7 | 22.3 | (19.4) | 126.5 | 103.3 | (18.4) |
| ප්‍රවාහන උපකරණ | 7.0 | 4.3 | (38.2) | 59.5 | 70.7 | 18.7 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 8.3 | 11.1 | 33.0 | 45.8 | 56.4 | 23.2 |
| මූල ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 5.4 | 9.3 | 73.3 | 29.2 | 44.6 | 52.6 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.5 | 1.0 | (32.6) | 8.1 | 13.8 | 70.1 |
| පිඟන්මැටි ආශ්‍රිත නිෂ්පාදිත | 2.7 | 2.3 | (12.6) | 14.3 | 12.8 | (10.4) |
| වෙනත් | 78.8 | 79.7 | 1.1 | 390.4 | 433.8 | 11.1 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **168.7** | **222.7** | **32.0** | **890.5** | **1,074.4** | **20.6** |
| තේ | 90.2 | 131.6 | 45.9 | 496.5 | 589.8 | 18.8 |
| පොල් | 27.9 | 27.9 | 0.0 | 142.7 | 143.7 | 0.7 |
| කුළුබඩු | 19.4 | 23.7 | 21.9 | 93.4 | 132.9 | 42.3 |
| මුහුදු ආහාර | 12.6 | 17.7 | 40.5 | 70.5 | 101.9 | 44.5 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 10.8 | 13.0 | 20.8 | 46.9 | 58.3 | 24.5 |
| රබර් | 2.5 | 2.9 | 14.6 | 15.1 | 21.9 | 44.5 |
| සකස් නොකළ දුම්කොළ | 3.0 | 3.1 | 4.2 | 14.4 | 13.5 | (5.9) |
| එළවළු | 2.4 | 2.8 | 17.3 | 11.1 | 12.4 | 11.9 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **3.4** | **4.1** | **19.7** | **17.7** | **19.9** | **12.6** |
| **මුළු අපනයන** | **780.1** | **841.2** | **7.8** | **4,229.7** | **4,410.2** | **4.3** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

**ආනයන ක්‍රියාකාරිත්වය**

පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන්, 2017 මැයි මාසයේ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 1,727 ක් දක්වා සියයට 8.6 කින් ඉහළ ගියේය.

2017 මැයි මාසයේ පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 386 ක් දක්වා සියයට 17.5 කින් ඉහළ ගිය අතර, ආහාර හා පාන වර්ග, විශේෂයෙන්ම සීනි සහ සහල් ආනයනය ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. 2017 ජනවාරි මාසයේ සිට දක්නට ලැබුණු සහල් ආනයන ඉහළ යෑමේ ප්‍රවණතාව 2017 මැයි මාසයේදීත් අඛණ්ඩව පැවති අතර දේශීය වෙළඳපොළ තුළ පැවති සහල් හිඟය සපුරාලීමට සහල් ආනයන දිරිගැන්වීම සඳහා රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග ඒ සඳහා හේතු විය. මේ අනුව, සහල් ආනයන පරිමාව 2016 මැයි මාසයේ වාර්තා කළ කිලෝග්‍රෑම් මිලියන 4 සිට 2017 මැයි මාසයේ දී කිලෝග්‍රෑම් මිලියන 34 ක් දක්වා ඉහළ යෑම හේතුවෙන් සහල් ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී දස ගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. තවද, සීනි ආනයන පරිමාව සහ ආනයන මිල ගණන් යන දෙකෙහිම ඉහළ යෑම හේතුවෙන් 2017 මැයි මාසයේ සීනි ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 38 ක් දක්වා සියයට 167.6 කින් ඉහළ ගියේය. මීට අමතරව, 2017 මැයි මාසයේ දී විදුලි සංදේශ උපකරණ, රෙදිපිළි හා උපාංග, රථවාහන සහ බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත වැනි ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය.

පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී 2017 මැයි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 427 ක් දක්වා සියයට 4.5 කින් ඉහළ ගිය අතර ප්‍රවාහන උපකරණ ආනයන ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. ගුවන් යානා උපාංග සහ රථවාහන ආනයන ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 28.3 කින් ඉහළ ගියේය. තවද, 2017 මැයි මාසයේ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම සියයට 2.2 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ පිඟන්මැටි ආශ්‍රිත නිෂ්පාදිත සහ යකඩ හා වානේ උපාංග ආනයන පහළ යෑම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම සුළු වශයෙන් පහළ ගියේය.

ප්‍රධාන වශයෙන්ම, ඉන්ධන ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2017 මැයි මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ.

ඩොලර් මිලියන 865 ක් දක්වා සියයට 1.6 කින් ඉහළ ගියේය. පිරිපහදු කළ ඛනිජතෙල් සහ ගල්අගුරු ආනයන පරිමා පහළ ගිය ද ඉන්ධන යටතේ වර්ග කර ඇති සියලුම කාණ්ඩවල සාමාන්‍ය ආනයන මිල ගණන් ඉහළ යෑම පිළිබිඹු කරමින් 2017 මැයි මාසයේ දී ඉන්ධන ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 15.3 කින් ඉහළ ගියේය. 2016 මැයි මාසයේ දී එ.ජ. ඩොලර් 48.84 ක් වූ බොරතෙල් බැරලයක ආනයන මිල 2017 මැයි මාසයේ දී එ.ජ. ඩොලර් 51.66 ක් දක්වා ඉහළ ගියේය. මීට අමතරව, ආනයන මිල ගණන්වල පහළ යෑමක් දක්නට ලැබුණ ද, ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් තිරිඟු හා ඉරිඟු ආනයන වියදම සියයට 73.7 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, 2017 මැයි මාසයේ දී රසායනික නිෂ්පාදිත, රබර් හා ඒ ආශ්‍රිත උපාංග සහ පොහොර ආනයන වියදම් පහළ ගියේය.

සමුච්චිත වශයෙන් සැලකූවිට, ප්‍රධාන වශයෙන්ම ඉන්ධන, රත්‍රන් සහ සහල් ආනයනය විශාල වශයෙන් ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ පළමු මාස පහ තුළ ආනයන වියදම 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 8,610 ක් දක්වා සියයට 12.6 කින් ඉහළ ගියේය. ඉන්ධන හා රත්‍රන් ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, පිළිවෙළින්, සියයට 63.0 කින් සහ සියයට 102.2 කින් ඉහළ ගිය අතර, සහල් ආනයන වියදම විසිගුණයකට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. කෙසේ වුවද, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, මෙම කාලපරිච්ඡේදය තුළ යන්ත්‍රසූත්‍ර හා උපකරණ, රථවාහන සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම් පහළ ගියේය.

2017 වසරේ ජනවාරි සිට මැයි දක්වා කාලපරිච්ඡේදය තුළ ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ජපානය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභව ලෙස අඛණ්ඩව පැවැති අතර, එම රටවල් වෙතින් සිදු කළ ආනයන, මුළු ආනයනවලින් සියයට 58 ක් පමණ විය.


## සංඛ්‍යා සටහන 2: ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2016 මැයි (එ.ජ.ඩො. මිලියන) | 2017 මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2016 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **328.1** | **385.6** | **17.5** | **1,753.6** | **1,901.2** | **8.4** |
| ආහාර හා පානවර්ග | 121.5 | 162.9 | 34.1 | 638.3 | 792.1 | 24.1 |
| සීනි හා රසකැවිලි | 14.3 | 38.2 | 166.5 | 108.7 | 124.7 | 14.8 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.3 | 16.0 | 594.1 | 9.2 | 130.5 | 1,313.6 |
| කිරි නිෂ්පාදිත | 23.0 | 26.5 | 15.4 | 97.1 | 136.9 | 41.1 |
| එළවළු | 25.4 | 25.4 | (0.2) | 165.5 | 149.7 | (9.6) |
| පාන වර්ග | 7.6 | 7.1 | (6.3) | 33.3 | 32.9 | (1.3) |
| කුළුබඩු | 11.3 | 10.4 | (8.1) | 56.3 | 43.4 | (22.9) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 37.5 | 39.4 | 5.0 | 168.2 | 173.9 | 3.4 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 206.7 | 222.7 | 7.7 | 1,115.3 | 1,109.1 | (0.6) |
| රථවාහන | 63.5 | 68.0 | 7.0 | 362.4 | 316.2 | (12.8) |
| විදුලි සංදේශ උපකරණ | 16.6 | 24.8 | 49.6 | 97.1 | 117.1 | 20.6 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 39.6 | 42.0 | 6.0 | 211.2 | 203.8 | (3.5) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 87.0 | 87.9 | 1.1 | 444.6 | 472.1 | 6.2 |
| **2. අන්තර් භාණ්ඩ** | **851.4** | **864.7** | **1.6** | **3,870.7** | **4,556.9** | **17.7** |
| ඉන්ධන | 187.1 | 215.7 | 15.3 | 873.6 | 1,423.9 | 63.0 |
| එයින්, බොරතෙල් | 33.4 | 36.2 | 8.2 | 159.9 | 243.8 | 52.5 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 152.3 | 179.4 | 17.8 | 617.4 | 1,009.3 | 63.5 |
| ගල්අඟුරු | 1.4 | 0.1 | (95.7) | 96.4 | 170.8 | 77.3 |
| දියමන්ති සහ අගනා ගල් හා ලෝහ වර්ග | 49.0 | 46.5 | (5.1) | 168.8 | 271.2 | 60.6 |
| එයින්, රත්‍රන් | 38.5 | 35.8 | (6.8) | 113.2 | 229.0 | 102.2 |
| තිරිඟු හා ඉරිඟු | 21.5 | 37.4 | 73.7 | 127.1 | 155.2 | 22.1 |
| කෘෂිකාර්මික යෙදවුම් | 11.9 | 20.5 | 72.7 | 72.2 | 77.2 | 6.9 |
| ඛනිජ නිෂ්පාදිත | 15.9 | 24.3 | 53.0 | 67.7 | 78.8 | 16.4 |
| ආහාර සැකසුම් | 22.3 | 29.5 | 32.4 | 97.3 | 128.2 | 31.7 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 234.6 | 227.3 | (3.1) | 1,131.3 | 1,087.9 | (3.8) |
| පොහොර | 14.3 | 4.5 | (68.7) | 68.4 | 27.1 | (60.4) |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 43.6 | 30.2 | (30.8) | 123.3 | 121.7 | (1.3) |
| රසායනික නිෂ්පාදිත | 84.4 | 66.9 | (20.7) | 365.5 | 341.1 | (6.7) |
| වෙනත් | 166.7 | 161.8 | (2.9) | 775.3 | 844.6 | 8.9 |
| **3. ආයෝජන භාණ්ඩ** | **408.8** | **427.3** | **4.5** | **2,016.7** | **2,041.9** | **1.3** |
| ප්‍රවාහන උපකරණ | 49.0 | 62.9 | 28.3 | 244.1 | 278.1 | 13.9 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 222.0 | 226.9 | 2.2 | 1,147.2 | 1,098.8 | (4.2) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 137.5 | 137.0 | (0.3) | 622.8 | 661.1 | 6.2 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.3 | 0.4 | 36.0 | 2.6 | 3.9 | 51.4 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.4** | **49.2** | **3,329.0** | **4.3** | **110.1** | **2,489.3** |
| **මුළු ආනයන** | **1,589.8** | **1,726.8** | **8.6** | **7,645.2** | **8,610.1** | **12.6** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

### වෙළඳ ශේෂය

2017 මැයි මාසයේ වෙළඳ හිඟය, 2016 මැයි මාසයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 810 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 886 ක් දක්වා පුළුල් විය. 2017 වසරේ පළමු මාස පහ තුළ සමුච්චිත වෙළඳ හිඟය, 2016 වසරේ පළමු මාස පහ තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,415 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 4,200 ක් දක්වා ඉහළ ගියේය.

### සංචාරක ඉපැයීම්

2017 වසරේ මැයි මාසයේ දී සංචාරක පැමිණීම් සියයට 2.5 කින් පහත වැටුණු අතර සංචාරක පැමිණීම් සංඛ්‍යාව 121,891 ක් විය. කෙසේ වෙතත්, 2017 වසරේ පළමු මාස පහ තුළ දී මුළු සංචාරක පැමිණීම්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී 887,093 ක් දක්වා සියයට 4.8 කින් වර්ධනය විය. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශය යන රටවල් 2017 වසරේ පළමු මාස පහ තුළ දී සංචාරකයන් පැමිණෙන ප්‍රධාන මූලාශ්‍ර වූ අතර, එම රටවලින් පැමිණි සංචාරකයන් සංඛ්‍යාව මෙම කාලපරිච්ඡේදයේ දී පැමිණි මුළු සංචාරකයන්ගෙන් සියයට 51.4 ක් විය. 2017 වසරේ මැයි මාසයේ දී සංචාරක ඉපැයීම් ද සංචාරක පැමිණීම් මෙන්ම අඩු වීමක් වාර්තා කළ අතර සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 209.1 ක් විය. 2017 වසරේ පළමු මාස පහ තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 1,521.9 ක් දක්වා සියයට 4.8 කින් වර්ධනය විය.

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

මැදපෙරදිග කලාපයේ පවතින අහිතකර ආර්ථික හා භූ-දේශපාලනික තත්ත්වය හේතුවෙන් 2017 වසරේ මැයි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඛණ්ඩව තුන්වන මාසයටත් අඩු විය. 2017 වසරේ මැයි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, පෙර වසර හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 575.4 ක් දක්වා සියයට 3.7 කින් අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2017 වසරේ පළමු මාස පහ තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සමුච්චිත ලැබීම් ද, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 2,797.0 ක් දක්වා සියයට 5.8 කින් අඩු විය.

## මූල්‍ය ලැබීම්

2017 වසරේ මැයි මාසයේ දී ශ්‍රී ලංකා රජය විසින් වසර දහයක කල් පිරීමේ කාලයක් සහිතව එ.ජ. ඩොලර් බිලියන 1.5 ක 11 වැනි ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවක් සිදු කරන ලදී. මැයි මාසය තුළ දී ශ්‍රී ලංකා රජය විසින් එ.ජ. ඩොලර් මිලියන 450 ක ඒකාබද්ධ ණය පහසුකමක් ද ලබා ගන්නා ලදී. මූල්‍ය ගිණුම වෙත වූ මෙම ලැබීම් ගෙවුම් තුලනය ශක්තිමත් වීම සඳහා සහාය විය. මෙයට අමතරව, වසරේ පළමු මාස පහ තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 191.1 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, එය පිළිවෙළින්, ද්විතීයික වෙළඳපොළ වෙත හා ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 127.8 කින් හා එ.ජ. ඩොලර් මිලියන 63.2 කින් සමන්විත විය. පසුගිය මාස දෙක තුළ දී පැවති ප්‍රවණතාව අනුව 2017 වසරේ මැයි මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 109.8 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. කෙසේ වුවද, 2017 වසරේ පළමු මාස පහ තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ සමුච්චිත විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 250.6 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. 2017 වසරේ පළමු මාස පහ තුළ දී ඒකාබද්ධ ණය පහසුකම තුළින් ලද මුදල් ද ඇතුළු රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 64.2 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 567.5 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය

2017 වසරේ පළමු මාස පහ තුළ දී සමස්ත ගෙවුම් තුලනය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,142.4 ක හිඟයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,586.6 ක අතිරික්තයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව තුළින් සහ ඒකාබද්ධ ණය පහසුකම තුළින් ලද මුදල් හේතුවෙන් 2017 වසරේ මැයි මස අවසානය වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 6.8 ක් විය. දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 4.0 කට ප්‍රමාණවත් වූ අතර, මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 5.2 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 8.9 ක් විය.

ශ්‍රී ලංකා රුපියල 2016 වසර අවසානයේ සිට 2017 ජූලි මස 31 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.6 කින් මධ්‍යස්ථ ලෙස අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකක වන යුරෝවලට සාපේක්ෂව සියයට 12.5 කින් ද, ස්ටර්ලින් පවුමට සාපේක්ෂව සියයට 8.8 කින් ද, ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 7.6 කින් ද, කැනේඩියානු ඩොලරයට සාපේක්ෂව සියයට 9.9 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව සියයට 11.6 කින් ද සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 8.0 කින් ද අවප්‍රමාණය විය.

## සංඛ්‍යා සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2016 මැයි (එ.ජ.ඩො. මිලියන) | 2017 මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2016 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන-මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 780.1 (ආ) | 841.2 | 7.8 | 4,229.7 (ආ) | 4,410.2 | 4.3 |
| ආනයන | 1,589.8 | 1,726.8 | 8.6 | 7,645.2 | 8,610.1 | 12.6 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -809.7 (ආ) | -885.6 | - | -3,415.5(ආ) | -4,199.9 | - |
| සංචාරක ඉපැයීම් | 214.5 (ආ) | 209.1 | -2.5 | 1,451.8(ආ) | 1,521.9 | 4.8 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 597.2 | 575.4 | -3.7 | 2,968.6 | 2,797.0 | -5.8 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | -17.8 | 34.7 | - | -37.3 | 191.1 | - |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) එයින්, | 300.2(ආ) | 2,252.0 | 650.2 | 837.6(ආ) | 3,040.3 | 263.0 |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 189.7 | 186.8 | -1.6 | 407.4 | 572.0 | 40.4 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | 1,500.0 | - | - | 1,500.0 | - |
| ඒකාබද්ධ ණය පහසුකම | - | 450.0 | - | - | 450.0 | - |
| දිගුකාලීන ණය | 109.8 (ආ) | 115.2 | 5.0 | 419.4(ආ) | 510.4 | 21.7 |
| විදේශීය සෘජු ආයෝජන (ඉ) | - | - | - | 129.4 | 146.5 | 13.2 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) ප්‍රාථමික සහ ද්විතියීක වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ඒකාබද්ධ ණය පහසුකම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

(ඉ) දත්ත පවතිනුයේ පළමු මාස තුන සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය ඇතුළත් වේ.